# Abstract No 81

## ශූන්‍යතා සංකල්පයෙන් පැනෙන කාන්තා බුද්ධත්වය

**යෝධකණ්ඩියේ අරියවංස හිමි**
ආරාධිත කථිකාචාර්ය, බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය, බෞද්ධ අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
arwansa@gmail.com

මහායාන ‘බෝධි සත්ත්ව-සංකල්පය’ ස්ථාපිත කිරීමට ‘බුද්ධ සංකල්පයේ’ (Buddha Concept) ඇති වාචාර්ථයට වඩා එහි පවත්නා ව්‍යංගාර්ථය ඉස්මතු කොට ගෙන ඇති බව මහායාන බුද්ධභූමි සූත්‍රය, විභාෂා ග්‍රන්ථය සහ මහා ප්‍රඥාපාරමිතා සූත්‍රය ආදි මූලාශ්‍රය පිරික්සීමේ දී පෙනේ. මහායානිකයෝ සියල්ලෝ ම බෝසත්වරු වන අතර ඒ සියලු දෙනා ම බුද්ධත්වය, බුද්ධයානය හෙවත් මහායානය ම පතන්නෝ ය. ඒ අනුව අනන්ත අපරිමාණ අසංඛ්‍ය සංඛ්‍යාත බුදුවරුන් වැඩ සිටින බව මහායාන බුදු දහමේ පිළිගැනීමයි. එයට හේතුව මහායානිකයන් සියල්ලන් ම බෝධිසත්ත්වවරුන් ලෙස පෙනී සිටීමයි. බෝසත්ත්වවරුන් වැඩි වන කල්හි බුදුවරු ද වැඩි වෙති. මෙමගින් මහායානිකයන් අර්ථගැන්වීමට උත්සාහ ගන්නේ පරම විමුක්තිය හෙවත් නිර්වාණය අවබෝධ කළ හැක්කේ බුද්ධත්වයට පත්වීමෙන් පමණක් බවයි. පසේ බුද්ධත්වයෙන් හෝ අරහන්ත බෝධියෙන් හෝ එය ලබාගත නො හැකි ය. එයින් අර්ථවත් වන්නේ ඕනෑ ම පුද්ගලයෙකුට ම බුද්ධත්වයට පත්විය හැකි බව යි. පාළි බෞද්ධ සාහිත්‍යයට අනුව කාන්තාවට සම්මා සම්බුද්ධත්වයට පත් විය නො හැකි ය.  බුදුවීමට නම් පිරිමි ආත්මයක් ලැබිය යුතු ය. තව ද ස්ත්‍රීන්ට ලැබිය නො හැකි බ්‍රහ්ම පදවිය, ශක්‍ර පදවිය,  මාර පදවිය, චක්‍රවර්ති රාජ පදවිය සහ බුද්ධ පදවිය වැනි පදවි පහක් (05) ද පාළි සාහිත්‍යයෙහි දක්වේ. නමුත් මහායාන ශූන්‍යතාවාද විග්‍රහයට අනුව කාන්තාවන්ට බුදු පදවිය ලැබිය නො හැකි ය යන සංකල්පය ප්‍රතික්ෂේප වේ. ලෝකයේ සියල්ල ශූන්‍ය ය. සියල්ල ශූන්‍ය නම් ස්ත්‍රී - පුරුෂ භේදය ද ශූන්‍ය විය යුතු ය. ඒ අනුව ස්ත්‍රීන්ට බුදු පදවිය ලැබිය නො හැකි ය යන අදහස හුදු ප්‍රලාපයක් පමණක් බව මහායාන ඉගැන්වීමයි. ශූන්‍යතා සංකල්පයෙන් පැනෙන කාන්තා බුද්ධත්වය යන ශීර්ෂයෙන් කෙරෙන මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ කාන්තා බුද්ධත්වය පිළිබඳ මහායාන බුදුසමයාගත ආකල්පය අධ්‍යයනය කිරීමයි. මේ සඳහා මහායාන සහ පාළි මූලාශ්‍රය ද, තදනුගත ද්විතීයික මූලාශ්‍රය ද භාවිත කෙරේ.

**ප්‍රමුඛ පද:** බුද්ධත්වය, කාන්තාව, ශූන්‍යතා සංකල්පය